**ගල්නෑව ප්‍රාදේශීය සභාව - 2022**

**------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ගල්නෑව ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ගල්නෑව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු දැන්වීම් පුවරු ගාස්තු රු.281,000 ක් සහ හිඟ දුරකථන කුළුණු ආදායම රු.9,000 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි. | පිළිගන්නා බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත් ආයෝජනය සහ ආපසු ලබා ගැනීමේ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.11,222,882 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.11,931,577 ක් ලෙස දක්වා තිබුණි. | 2021 වර්ෂයේ සථාවර තැන්පත් ආයෝජනය රු.1,468,463 ක් හා 2022 වර්ෂයේ ස්ථාවර තැන්පත් රු.13,400,040 ක් බැවින් ශුද්ධ මුදල් ප්‍රවාහය රු.11,222,882 ක් වූ බව. | -එම- |
| (ඇ) | 2021 වර්ෂයේදී වැඩ නිමකර තිබුණු භාවිතයට ගනු ලබන රු.3,877,998 ක ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂයේ දේපළ පිරියත හා උපකරණ යටතේ වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | සභාවට අයිති නොමැති වත්කම් බැවින් දේපළ පිරියත හා උපකරණ යටතේ දක්වා නැති බව. | භාවිතයට ගන්නා වත්කම් පවරාගෙන දේපළ, පිරියත සහ උපකරණ ලෙස දැක්විය යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග සහ ණයහිමියන් ලෙස ලැබී තිබුණු ස්ථාවර වත්කම් රු.20,192,340 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. | මෙම පරිත්‍යාග භාණ්ඩ මෙහිදී මුදල් ගලාඒමක් ලෙස සලකා ඇති බව | ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල්මය නොවන ප්‍රවාහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ නොදැක්විය යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී අබලි භාණ්ඩ වෙන්දේසියෙන් ලැබුණු රු.21,000 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | වත්කම් ඉවත් කිරීමේදී ලාභ අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශයට ගලපන බැවින් මුදල් ගලාඒමක් සිදු නොවන ලෙස සලකා ඇති බව. | මුදල් ලැබීමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සභාව සතු ස්ථාවර තැන්පතු කල් පිරීමේ දිනයන් අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පත් වෙනුවෙන් ලැබිය යුතු උපචිත පොලි රු.707,277 ක් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | ස්ථාවර තැන්පත් පොලී විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සඳහන් කර ඇති බව | සමාලෝචිත වර්ෂයට අදාළ පොලිය ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල ලෙජර් ගිණුම් අනුව රු.579,419,742 ක් වුවත් ශේෂ පිරික්සුම අනුව එය රු.572,736,653 ක් වුයෙන් රු.6,683,089 ක වෙනසක් විය. | පිළිගන්නා බව. | අනුරූපී වාර්තා සමඟ සැසඳිය යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 396 (ඇ) | නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ කල් ඉකුත් වූ රු.12,193 ක්වූ චෙක්පත් 03 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | රු.12,193 ක චෙක්පතක් පමණක් ගෙවීමට ඉදිරිපත් කර නැති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | උතුරු මැද පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2020 අගෝස්තු 28 දිනැති අංක NCP/LG/DE/04/04/2020 දරන ලිපිය | සභාවේ යන්ත්‍ර සහ මහන මැෂින් ණය පදනම මත ලබාදීමෙන් රු.61,450 ක් අය විය යුතුව පැවතුණි. | රු.391,000 ක් 2023 ජනවාරි මස ලැබී ඇත. ඉතිරි හිඟ මුදල් අයකරමින් පවතින බව. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.6,683,088 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.15,987,213 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,041,400 | 1,251,800 | 1,134,500 | 993,350 | 1,120,400 | 1,009,950 | 1,146,900 | 876,050 |
| (ii) | කුලී | 5,658,500 | 6,895,250 | 6,586,531 | 5,098,426 | 4,861,550 | 4,617,150 | 9,677,113 | 4,789,767 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 439,000 | 271,000 | 282,000 | 169,925 | 422,950 | 345,300 | 360,850 | 180,925 |
| (iv) | වෙනත් ආදායම් | 14,451,620 | 27,045,936 | 27,121,520 | 13,698,423 | 24,290,689 | 29,477,495 | 32,950,766 | 13,774,007 |
| | | 21,590,520 | 35,463,986 | 35,124,551 | 19,960,124 | 30,695,589 | 35,449,895 | 44,135,629 | 19,620,749 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| (i) | හිඟ කසළ බදු රු.690,250 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ මුදලින් රු.133,100 ක් අය කරගෙන ඉතිරි හිඟ සඳහා නඩු පවරා ඇති බව. | හිඟ මුදල් අයකර ගත යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට අයවිය යුතු ටෙන්ඩර් බදු කුලී රු.1,468,604 ක් වූ අතර ඒ තුළ වසර දෙකකට වඩා පැරණි අයවිය යුතු රු.306,242 ක් විය. | හිඟ මුදලින් රු.62,663 ක් අයකරගෙන ඇති බව. | -එම- |
| (iii) | වෙළඳ අයිතිය බදුදීම සහ සභාව සතු කඩ කාමර කුලියට ලබාදීම වෙනුවෙන් වසර දෙක ඉක්මවා ලැබිය යුතු ශේෂය රු.1,224,600 ක් විය. | මෙම හිඟ බදුකරුවන් සම්බන්ධයෙන් නඩු පවරා ඇති බව. | -එම- |

**(ආ) කුලී**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කඩකුලී මුළු වටිනාකම රු.2,371,350 ක් වූ අතර ඒ තුළ වර්ෂ 01 ට වැඩි රු.1,557,100 ක් විය. | හිඟ මුදලෙන් රු.376,850 ක් අය කරගෙන ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා නඩු පවරා ඇති බව. | -එම- |

**(ඇ) වෙනත් ආදායම්**

| | | | |
|---|---|---|---|
| (i) | සභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් පුවරු පිළිබඳ සමීක්ෂණයක් සමාලෝචිත වර්ෂයේදීද සිදුකර නොතිබුණු අතර රු.281,000 ක් හිඟ ආදායමක්ද අයකරගෙන නොතිබුණි. | පිළිගන්නා බව. | -එම- |
| (ii) | ප්‍රාදේශිය සභාව විසින් පවත්වාගෙන යනු ලබන ජල ව්‍යාපෘති 04 කින් සපයන ලද ජලය වෙනුවෙන් සහ නව සම්බන්ධතා ලබාදීම වෙනුවෙන් ලැබිය යුතු රු.772,049 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ මුදලෙන් රු.1,077,094 ක් අය කරගෙන ඇති බව. | -එම- |
| (iii) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.10,874,349 ක් හා මුද්දර ගාස්තු රු.554,100 ක් විය. | පිළිගන්නා බව. | හිඟ මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**ගෝසාතකාගාර පහසුකම් ලබානොදීම හා මස් අළෙවිය වෙනුවෙන් ගාස්තු අයකර නොතිබීම**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නැගම, ගල්නෑව නගරය සහ වෙරුන්කුලම යන ප්‍රදේශවල මස් අලෙවිසැල් 03 ක් වාර්ෂික බදුදීම් සිදුකර තිබුණු නමුත් එම මස්හල් සඳහා වන ගෝසාතකාගාර පහසුකම් සභාව විසින් සම්පාදනය කර නොතිබුණි. | ඉදිරියේදී ඉඩමක් ලබාගෙන සෝතකාගාර ඉදිකරන බව. | සෝතකාගාර ඉදිකිරීමට ක්‍රියාකළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 1988 අගෝස්තු 23 දිනැති අතුරු ව්‍යවස්ථා ගැසට් නිවේදනයේ 32 අතුරු ව්‍යවස්ථාව 09 වගන්තිය ප්‍රකාරව බල ප්‍රදේශයේ පරීක්ෂා කරනු ලබන සෑම මස් කිලෝ 01 ක් සඳහාම සභාවේ ලාංඡනය භාවිතා කිරීම වෙනුවෙන් රු.10 කට නොවැඩි ගාස්තුවක් සභාවට අයකරගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ඒ අනුව කටයුතු කරන බව. | පොදු සම්මත අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ප්‍රාදේශීය සභාවට අයත් පුස්තකාලවල වටිනාකම රු.38,236 ක් වූ පොත් අස්ථානගතවීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය හා පරිපාලනයට අදාල 2020 වර්ෂයේ හඳුන්වාදී ඇති රීති 13 සහ 14 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පිළිගන්නා බව. | රීති ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

**පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් එකතුවන කසළ ප්‍රමාණය ප්‍රතිචක්‍රියකරණය සඳහා භාවිතා කර නොතිබුණු අතර කසළවලින් වැඩි ප්‍රමාණයක් පරිසරයට නිරාවරණය වන පරිදි ගොඩගසා තිබුණි. කසළ මධ්‍යස්ථානයේදී නිපදවන ලද කාබනික පොහොර අලෙවි කර ගැනීමට වැඩපිළිවෙලක් සකස් කර නොතිබීම නිසා 2022 දෙසැම්බර් 06 දින වනවිට කාබනික පොහොර කිලෝ 14960 ගබඩා කර තබාගෙන තිබුණි. | කසළ වර්ග කර ලබාගන්නා අතර කොම්පෝස්ට් පොහොර නිපදවා අලෙවි කරන බව. | කාබනික පොහොර අලෙවි කිරීම වර්ධනය කරගත යුතුය. |